# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2216/14 - 2021 පෙබරවාරි මස 24 වැනි බදාදා - 2021.02.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/14/29.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

1. ගරු ශිරාන් ඇන්තනි ගුණරත්න මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු
2. ගරු ප්‍රියන්ත ප්‍රනාන්දු මැතිතුමා
   අභියාචනාධිකරණ විනිසුරු
3. ගරු දමිත් තොටවත්ත මැතිතුමා
   මහාධිකරණ විනිසුරු
4. කේ.එම්.එම්. සිරිවර්ධන මැතිතුමා
   නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව
5. ආචාර්ය සනත් ජයනෙත්ති මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ උපදේශක (වෙළඳ)
6. පී.ඒ. ඩයස් මැතිතුමා
   හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව
   හිටපු අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

ශ්‍රී ලංකා රේගුව සම්බන්ධයෙන් එල්ලවන විවිධ චෝදනා හා සිදුවෙතැයි සැලකෙන අක්‍රමිකතාවයන් වළක්වා ගනිමින්, ආනයන හා අපනයන සම්බන්ධයෙන් අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු හා පාර්ශවකරුවන් සමග සම්බන්ධීකරණයෙන් එක්ව කටයුතු කරමින් රජයේ ආදායම ඉහළ නංවමින් නීත්‍යානුකූල වෙළඳාම් පහසුකරලීම අත්‍යවශ්‍ය කරුණක් බව සැළකිල්ලට ගනිමින් ද;

එකී වගකීම් ඉටු කිරීමේදී ශ්‍රී ලංකා රේගුවෙහි ආයතනික, පරිපාලනමය සහ මෙහෙයුම් ක්‍රියාවලීන් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීම මූලික අවශ්‍යතාවයක් බව ම විසින් අදහස් කරන හෙයින්ද;

මෙහි මින්මතු දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කිරීම අවශ්‍ය යැයි මා අදහස් කරන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තියෙන් හා විශ්වාසයෙන් යුතුව, සංශෝධිත පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරය වන) 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉහත කී,

1. ගරු ශිරාන් ඇන්තනි ගුණරත්න මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු
2. ගරු ප්‍රියන්ත ප්‍රනාන්දු මැතිතුමා
   අභියාචනාධිකරණ විනිසුරු
3. ගරු දමිත් තොටවත්ත මැතිතුමා
   මහාධිකරණ විනිසුරු
4. කේ.එම්.එම්. සිරිවර්ධන මැතිතුමා
   නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව
5. ආචාර්ය සනත් ජයනෙත්ති මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ උපදේශක (වෙළඳ)
6. පී.ඒ. ඩයස් මැතිතුමා
   හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව
   හිටපු අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

වන ඔබතුමන්ලා මතු දැක්වෙන කරුණු විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම සහ වාර්තා කිරීම සම්බන්ධයෙන් මාගේ කොමසාරිස්වරුන් ලෙස මෙයින් පත්කරමි.

එකී කරුණු කවරේද යත්,

(අ) ශ්‍රී ලංකා රේගුවෙහි සිදුවෙතැයි සැළකෙන දූෂිත ක්‍රියා වැළැක්වීම සඳහා ක්‍රමවේදයන් නිර්දේශ කිරීම පිණිසත්, පරිපාලනමය හා තාක්ෂණික අඩුපාඩු හඳුනා ගැනීම සඳහාත්, පවත්නා තත්ත්වය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහාත්, දැනට ක්‍රියාත්මක ව්‍යුහයන්, පද්ධති සහ ක්‍රියාපටිපාටි අධ්‍යයනය කිරීම.

(ආ) ආරක්ෂාව සහ නිරෝධායන නීති කෙරෙහි අවධානය යොමු කරමින්, උපරිම වෙළඳ පහසුකම් සැපයීම සහතික කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සහ රේගු ක්‍රියාපටිපාටි එකිනෙක සමායෝජනය වන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම.

(ඇ) දැනට ක්‍රියාත්මක බන්ධිත ගුදම් පහසුකම්, ඒවායේ යටිතල පහසුකම් පිළිබඳ සමාලෝචනයක් සිදුකර, හොඳින් ඒකාබද්ධ වූ තොරතුරු තාක්ෂණ පද්ධතියක් හරහා ඒවායේ මෙහෙයුම් විධිමත් කිරීම.

(ඈ) ආදායම් සංරක්ෂණ නියෝගයන් (Revenue Protection Order) සඳහා භාවිතා කරනු ලබන බහුතීරු ගාස්තු සමාලෝචනය කිරීම.

(ඉ) ශ්‍රී ලංකා රේගුව මගින් සිදුකර ඇති සියළු අභ්‍යන්තර අධ්‍යයනයන් සමාලෝචනය කිරීම.

(ඊ) රේගු වෘත්තීය සංගම් විසින් ඉදිරිපත් කර ඇති සියළු යෝජනා සමාලෝචනය කිරීම.

(උ) ස්වයංක්‍රීයකරණය හරහා රේගු පරිපාලනය නවීකරණය කිරීම.

(ඌ) ASYCUDA පද්ධතිය හරහා අවදානම් තක්සේරු කිරීම ශක්තිමත් කිරීම.

(එ) මානව සම්පත් පිළිබඳ ජාත්‍යන්තර පූර්වාදර්ශයන් ක්‍රියාත්මක කිරීම තුළින් රේගු කළමනාකරණය ශක්තිමත් කිරීම.

(ඒ) රජයේ ආදායම, ආර්ථිකය හා ජාතික ආරක්ෂාව, සෞඛ්‍ය ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සඳහා රේගුව විසින් ක්‍රියාවට නංවන ලද ප්‍රතිලාභ පද්ධති සහ රේගු බුද්ධි කළමනාකරණයේ ඵලදායීතාව සමාලෝචනය කිරීම.

(ඔ) බැංකු, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, විදේශ විනිමය හා නියාමන ආයතන සමග අන්තර් ආයතනික ගනු දෙනු සමාලෝචනය කිරීම.

(ඕ) ශ්‍රී ලංකා රේගුව කලාපයේ හොඳම රේගුව බවට පත්කිරීම සඳහා දූෂිත ක්‍රියාවන්, අක්‍රමිකතා සහ පරිපාලන බලය අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා වහා ගත යුතු කෙටිකාලීන ක්‍රියා මාර්ග මෙන්ම, මධ්‍යම හා දිගු කාලීන ආයතනික ප්‍රතිසංස්කරණ නිර්දේශ කිරීම.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, ගරු ශිරාන් ඇන්තනි ගුණරත්න මැතිතුමා, පූර්වෝක්ත කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් මම මෙයින් පත්කරමි.

තවද, පූර්වෝක්ත කරුණු පිළිබඳව ඔබහට පෙනී යන පරිදි අවශ්‍ය විය හැකි පරීක්ෂණ සහ සියලුම විමර්ශන පැවැත්වීමට ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබහට මෙයින් බලය හා අධිකාරිය පවරන අතරම, ඔබගේ පරීක්ෂණයන්ගෙන් අනාවරණය වන කරුණු සහ ඔබ ගේ නිර්දේශ ගෙනහැර දක්වමින් ඔබ ගේ අත්සනින් යුතුව එකී කරුණු පිළිබඳව අතුරු වාර්තාවක් 2021 මාර්තු මස 30 වැනි දිනට පෙර ද, අවසන් වාර්තාව 2021 මැයි මස 30 වැනි දිනට පෙර ද මා වෙත ඉදිරිපත් කරන මෙන් ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, පූර්වෝක්ත කාරණාවලට අදාළ වන කිසියම් විමර්ශනයක හෝ පරීක්ෂණයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබේ අභිමතය පරිදි නිශ්චය කරනු ලැබේ නම්, එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු යැයි මම ඔබට නියම කරමි.

තවද, ඔබගේ විමර්ශනයන්හි හෝ පරීක්ෂණයන්හි කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන්, ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි නිලධරයන් සහ සෙසු තැනැත්තන් විසින් තත්කාර්යය සඳහා නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලුම සහාය දිය යුතු යැයි ද, සපයනු ලැබිය හැකි සියලුම තොරතුරු සැපයිය යුතු යැයි ද මෙයින් නියම කොට විධාන කරමි.

තවද, මහජනතාව, වෙළෙඳ සංගම්, වාණිජ මණ්ඩල ආදී පාර්ශවයන්ගෙන් අදහස් හා යෝජනා කැඳවීම සිදුකළ යුතු බව ද සඳහන් කරමි.

තවද, පූර්වෝක්ත පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 අධිකාරය) 14 වන වගන්තියෙහි විධිවිධාන, මේ කොමිෂන් සභාවට අදාළ විය යුතු බව මම මෙයින් ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසිඑකක් වූ පෙබරවාරි මස 24 වැනි දින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.